# බෞද්ධ දේශපාලන ආචාරධර්ම පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයනයක්

**පූජ්‍ය ගෝනලගොඩ නන්ද හිමි**

## හැඳින්වීම

සමාජයක ජීවත් වන පුරවැසියන් වශයෙන් දේශපාලනය පිළිබඳ යම් වැටහීමක් තිබීම අවශ්‍යය ය. ඊට ප්‍රධාන හේතුවක් වනුයේ මානවයා දේශපාලන සත්ත්වයයෙකු ලෙස දැන හෝ නො දැන විවිධ ක්‍රියාකාරකම්හි නිරත වන බැවිනි. ක්‍රි.පූ. 06වන සියවසේ සිය ඉගැන්වීම ලෝකයාට විවර කළ බුදුන් වහන්සේගේ දර්ශනය තුළ දේශපාලනය හා සම්බන්ධ විවිධ විග්‍රහ දැකිය හැකි ය. මෙහි දී සාකච්ඡාවට බඳුන් කරනුයේ බුදුන් වහන්සේගේ දේශපාලනය පිළිබඳ විග්‍රහයන්හි එන ආචාරධර්ම සම්බන්ධයෙනි. එසේ ම නූතන දේශපාලන ක්‍රියාවලියට බෞද්ධ දේශපාලන ආචාරධර්ම කෙසේ උපයෝගී කළ හැකි ද යන්න විමසා බලනු ලැබේ.

## සන්දර්භය

බෞද්ධ ආචාරධර්ම සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි දේශපාලන ආචාරධර්මයන්ට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. බුදුන් වහන්සේ තම දේශනාවල දී දේශපාලන ආචාරධර්ම වශයෙන් වෙන් වූ ආචාරධර්ම පද්ධතියක් දේශනා කොට නොමැත. එහෙත් උන් වහන්සේගේ ඉගැන්වීම් පාදක කොට ගනිමින් දේශපාලනයට අදාළ ආචාරධර්ම වෙන්කොට හඳුනාගත හැකි ය. දර්ශන විෂයෙහි ද ප්‍රධාන වශයෙන් සාකච්ඡා කෙරෙන දේශපාලනය සම්බන්ධයෙන් පෙරදිග මෙන් ම බටහිර ද විවිධ දේශපාලන හර පද්ධතීන් දක්වා ඇත. ඒ අතුරින් පෙරදිග බෞද්ධ දේශපාලන දර්ශනය සුවිශේෂී වූවක් බව කරුණු අධ්‍යයනයෙන් තහවුරු වේ. බෞද්ධ දේශපාලන දර්ශනයෙහි මූලික හර පද්ධතිය බිහි වීම පිණිස පැවති සාමාජීය තත්වය මෙන් ම ආගමික පරිසරය ද ඉවහල් වී ඇත. බුදුන් වහන්සේ හා සමකාලීන තොරතුරු විමසීමේ දී රාජ්‍ය විචාළීම සම්බන්ධයෙන් ක්‍රම ද්විත්වයක් පැවති බව පෙනේ.

- රාජතන්ත්‍රවාදය (Monarchism)
- සමූහාණ්ඩුවාදය (Republicanism) **(කලුපහන, 2005: 189).**

මේ ආකාරයට බුදුන් වහන්සේ ධරමාන අවධියෙහි රාජ්‍ය පාලනය පැවතිණි. බ්‍රාහ්මණාදී විවිධ ආගම් රාජ්‍ය පාලනය මෙන් ම ඒ හා සබැඳි නීතිරීති දේවත්වයට

ආරෝපණය කරමින් විග්‍රහ කොට ඇත. මහා බ්‍රහ්මයාගේ බාහුද්වයෙන් නිපන් ක්‍ෂත්‍රිය වංශය සිදු කළ යුතු වනුයේ බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන ස්වධර්ම පමණකි. බටහිර ග්‍රීක ආදි යුගවල පැවති රාජ්‍ය පාලනය ද දේවියන් වහන්සේගේ නිර්මාණයක් ලෙස මුල් කාලයේ සිතුහ. ප්ලේටෝට පූර්වයෙන් සිටි චින්තකයෙකු වන හෝමර්ගේ කෘතිවලට අනුව රජුන් යනු දෙවියන්ගෙන් පැවත එන පිරිසකි. **(සමරනායක, 2004: 40).** එහෙත් බුදුන් වහන්සේගේ ඉගැන්වීම මෙම දේවවාදී ඉගැන්වීමට සපුරා වෙනස් වේ. අග්ගඤ්ඤ සූත්‍රයේ ඇති පරිදි රාජ්‍යත්වය බිහිවනුයේ සාමාජීය අවශ්‍යතාවයක් මත පදනම් ව ය. සන්නිධිකාර පරිභෝජනය හේතුවෙන් සමාජයේ ගැටලු මතු වූ අතර එයට විකල්පයක් ලෙස ගැටලු විසඳීමට හා නැවත ගැටලු ඇති නො වීමට මහාසම්මතයට අනුව පාලකයෙකු බිහි කිරීම සිදු වී ඇති බව අග්ගඤ්ඤ සූත්‍රයේ දැක් වේ. ඒ අනුව

- දොස් නැගිය යුත්තාට නිසි පරිදි දොස් නැඟීම.
- ගැරහිය යුත්තාට ගැරහිම
- නෙරපිය යුත්තා නෙරපීම **(දීඝ නිකාය, 1976: 156-157).**

ආදි කාර්යන් මහාසම්මත පුද්ගලයා විසින් සිදු කළ යුතු ය. අනතුරු ව දෙවන ව්‍යවහාරය පරිදි ක්ෂේත්‍රයට අධිපති යන අර්ථයෙන් 'ඛත්තියො' ක්‍ෂත්‍රිය නමින් ද අන්‍යන් ධාර්මික ව සුවපත් කරන හෙයින් රාජ යන අන්වර්ථයෙන් ද හැඳින් විය. **(එම, 158-159).** සාමන්‍යයෙන් ව්‍යවහාරිත දේවවාදී අර්ථයෙන් බැහැර ව රාජ්‍ය පාලනය පිළිබඳ මානුෂිකත්වයෙහි ලා ගැනෙන ප්‍රයෝගික අර්ථයෙන් පාලනයෙහි ආරම්භය සම්බන්ධයෙන් බුදුන් වහන්සේ දේශනා කොට ඇත. මේ ආකාරයේ ප්‍රායෝගික ප්‍රභවයක් සහිත රාජ්‍ය පාලකයා කෙසේ ආචාර්ය සම්පන්න ව රාජ්‍ය විචාළ යුතු ද යන්න මෙතැන් සිට සාකච්ඡා කෙරේ.

යහපත් ආකාරයෙන් රාජ්‍ය විචාරන රාජ්‍ය පාලකයා මරණින් මතු දිව්‍ය සම්පත් ලබන බව බුදුන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි දේශනා කොට ඇත. 'ඛත්තියො පි ඛො වාසෙට්ඨා කායෙන සුචරිතං චරිත්වා, වාචාය සුචරිතං චරිත්වා, මනසා සුචරිතං චරිත්වා, සම්මාදිට්ඨිකො සම්මාදිට්ඨිකකම්මසමාදානො සම්මාදිට්ඨිකකම්මසමාදානාහෙතු කායසස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති' (එම. 162-163). මරණයෙන් පසු දිව්‍ය ලෝකයට ගමන් කිරීමට නම් කයින්, වචනයෙන්, මනසින් යහපත් චර්යාවක් පවත්වා ගත යුතු ය. එසේ ම යහපත් දෘෂ්ටි හා යහපත් කර්ම සමාදාන හේතුවෙන් මරණයෙන් පසු ව දිව්‍ය ලෝකයට පැමිණේ. අග්ගඤ්ඤ සූත්‍රාගත කරුණුවලට අනුව රජු යහපත් ක්‍රියා කරන්නේ නම් මරණයෙන් පසු ව යහපත් ලෝකයට ගමන් කරයි. මෙහි දී කාය, වාග්, මනෝ සංවරය පවත්වා ගත යුතු බව අවධාරණය කොට ඇත. මේවායේ සංවරයක් පවත්වා ගැනීමෙන් අකුසල් හෝ පව් සිදු නො වේ. ඒ අනුව බෞද්ධ දේශපාලන ආචාරධර්මයෙහි පළමු අංගය ලෙස රාජ්‍ය පාලකයා කයින්, වචනයෙන්, මනසින් සංවරවීම අගය කොට ඇත. කාය සංවරය හා වාග් සංවරය පවත්වා ගැනීමෙන් යුද්ධ ආදි පාපී කටයුතුවලින්

මිදිය හැකි බවත් මනෝ සංවරය පවත්වා ගැනීමෙන් එ වැන්නක් සිතීම පවා නතර කොට ඇති බවත් ගම්‍ය කළ හැකි ය.

බෞද්ධ දේශපාලන දර්ශනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි චක්කවත්ති සීහනාද සූත්‍රය සුවිශේෂී වේ. දේශපාලන දර්ශනයෙහි ක්‍රියාත්මක විය යුතු ආචාරධර්ම මනාව ක්‍රියාත්මක වීම මත චක්‍රරත්නයක් පහළ වන ආකාරය පිළිබඳ මෙම සූත්‍රයෙන් කියවේ. පෙර දළ්හනේමි යනුවෙන් හැඳින්වෙන 'ධම්මිකො රාජා' (**දීඝ නිකාය, 1976: 98-99**). ධාර්මික ව රජකම් කළ අයෙක් විසී ය. මෙම රජු මහමුහුද මෙන් ම භූමිය ද දඬුවමින් තොර ව, අවියෙන් තොර ව, දැහැමෙන් සෙමෙන් දිනා අධිපති ව වාසය කළ බව සඳහන් වේ. (**එම**). එහි දී දේශපාලන ආචාර ධර්ම අතුරෙන් සුවිශේෂී ආචාර ධර්මයක් මතු වී ඇත. එනම් සක්විති රජුට චක්‍ර රත්නයක් පහළ වනුයේ තමාගේ ධාර්මික බව නිසා ය. එය සිය පුත්‍රයාට ලබා දිය හැකි නො වේ. පුත්‍රයාට ද චක්‍ර රත්නය පහළ කර ගැනීමට අවශ්‍ය නම් ධාර්මික විය යුතු ය. වර්තමානයෙහි පිය පුතු පරපුරට දේශපාලනය දෝලනය වන අවස්ථා ඇතැම් තැන්හි දැකිය හැකි ය. එහි දී රාජ්‍ය පාලනයට වඩා නරුම පාලන ක්‍රමවේදයක් බිහි වේ. නමුත් දිය ගොඩ හැම තැන්හි බලය පැතිර වූ සක්විති රාජ්‍ය තනතුර ලබා ගැනීමට නම් සදාචාර සම්පන්නව දැහැමි පාලනයක් ගෙන යා යුතු ය. එහි දී පියා විසින් සිය පුත්‍රයාට ලබා දෙන අවවාදය වර්තමාන දේශපාලන ප්‍රවාහයට ද අතිශයින් වැදගත් වේ. ධර්මය ඇසුරු කරමින්, ධර්මයට සත්කාර කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මයට බුහුමන් කරමින්, ධර්මය පුදමින්, ධර්මයට ම යටහත් පැවත්ම දක්වමින්, ධර්මය ධජයක් සේ පෙරටු කොටගෙන, ධර්මය කුන්තකයක් සේ ඔසවා ගත්තෙක් ව, ධර්මය ම ආධිපත්‍ය කොට ඇත්තෙක් ව, කටයුතු කළ යුතු ය.

1. ධර්මය ගුරු තැන්හි තබා අඹුදරුවන්ගේ ආරක්ෂාව සැලසීම
2. හමුදාව කෙරෙහි යුතුකම් ඉටුකිරීම
3. රජ පරපුරට අයත් පිරිස කෙරෙහි ආරක්ෂාව සැලසීම
4. බමුණන් හා ගහපතීන් කෙරෙහි ගරු සැලකිලි දැක්වීම
5. නියම්ගම් වැසි ජනපදවාසීන් කෙරෙහි රැකවරණය සැලසීම
6. රට තුළ වෙසෙන ශ්‍රමණයන් හා බ්‍රාහ්මණයන් කෙරෙහි ගෞරව දැක්වීම
7. සතුන් හා පක්ෂීන් කෙරෙහි ආරක්ෂාව සැලසීම
8. රට තුළ අධර්ම ක්‍රියා සිදු වීම වැළක්වීමට පියවර ගැනීම
9. දුප්පතුන්ට ධනය දී අභිමත කාර්යන්ට යොමුකොට සැපතට පමුණුවාලීම
10. රටෙහි වෙසෙන ආධ්‍යාත්මික නායකයන් හමු වී කුසල අකුසල ආදි කරුණු සාකච්ඡා කිරීම (**එම, 100-102**).

මේ ආකාරයෙන් හඳුනාගත හැකි දස සක්විතිවත් උගෙන පුරුදු පුහුණු කළ යුතු බව කියවේ. දස සක්විතිවත්හි එන කරුණු තුළ ද දැකිය හැකි වනුයේ ආචාර සම්පන්න බවකි. දස සක්විතිවත් පූරණය කළ හැකි නම් චක්‍රවර්ති රාජ පදවිය ලබා ගත හැකි ය. එසේ ම ධර්මයෙන් ආඥා චක්‍රය පතුරවන බැවින් කිසිවෙකුට හෝ එම ආඥා චක්‍රය ප්‍රතිවර්තනය කළ හැකි ද නො වේ. 'තං හොති චක්කං අප්පතිවත්තියං කේනචි මනුස්සභූතෙන පච්චත්ථිකේන පාණිනා' **(අංගුත්තර නිකාය 3, 1976: 244-245).** යන්නෙන් ධම්මරාජ සූත්‍රයෙහි දැක්වෙනුයේ එය යි. වර්තමානයෙහි බල අරගලය හේතුවෙන් ඇතැම් රටවල් යුද්ධය වෙත පැමිණෙන බවක් පෙන්නුම් කරනු ලැබේ. නමුත් ධාර්මික ව රාජ්‍ය විචාළත්තේ නම් යුද්ධයක් ඇති නො කොට දිය ගොඩ සැම තැන බලය පැතිර විය හැකි ය. චක්‍රවර්ති රාජ සංකල්පය කිසි දිනෙක බිහි නො වේ යනුවෙන් තර්ක කරන පිරිස් ද වෙත්. එ ලෙස බිහි වූවා හෝ නො වූවා එම සංකල්පයෙන් ගම්‍ය වන අර්ථය සියලු රාජ්‍ය නායකත් තුළ පවතින්නේ නම් සදාචාර සම්පන්න හා එකිනෙකාට ගෞරවය දක්වන ලෝකයක් නිර්මාණය කළ හැකි ය. තව ද චක්‍රවර්ති රාජ සංකල්පය මගින් සාකච්ඡාවට ලක් වෙන දේශපාලන ආචාර ධර්මයන් හුදෙක් ඒකීය රාජ්‍යක් මුල් කොට ගත්තක් නො වන බව ද හඳුනාගත යුතු ය.

රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් සණ තන්ත්‍ර හෙවත් සමූහාණ්ඩු පාලනය යහපත් පාලන ක්‍රමවේදයක් ලෙස බුදුන් වහන්සේ අගය කළහ. බුදුන් වහන්සේ රජගහනුවර සමීපයේ ගිජ්ඣකූළ පව්වෙහි වාසය කරන කල්හි අජාසත් රජු වස්සකාර ඇමතියා ලවා සිය මනෝරථයක් වූ වජ්ජි ජනපදය පරාජය කිරීමට හැකියාවක් ඇත් ද යන්න විමසාලී ය. එහි දී බුදුන් වහන්සේ දේශනා කොට ඇත්තේ විශාලා මහනුවර සාරන්දද චෛත්‍ය සමීපයේ තමන් වාසය කරන කල්හි වැදෑ රජුන්ට සප්ත අපරිහානීය ධර්ම (Seven conditions of welfere) දේශනා කළ බව ය.

1. නිතර නිතර රැස්වීම
2. වැදෑ රජුන් සමඟ රැස්වීම, සමඟ ව කටයුතු කිරීම, සමගි ව නැඟී සිටීම.
3. නො පැන වූ නීති නො පැනවීම, පැන වූ නීති නො සිඳීම, පනවන ලද පොරණ වැදෑ දහම්හි පිහිටා කටයුතු කිරීම.
4. මහලු වැදෑවනට සත්කාර, ගරුකාර, පූජා ආදිය කිරීම හා ඔවුන්ගේ බස් ඇසිය යුතු කොට සිතීම.
5. කුල ස්ත්‍රීන් හා කුල කුමාරිකාවන් ඇදගෙන ගොස් බලහත්කාරයෙන් තමන් වෙත නො වස්වන්නාහු.
6. නුවර ඇතුළතත් බැහැරත් වැදෑ රජුන්ගේ යම් වැදෑ දෙවොල් කෙනෙක් වෙත්නම් එවාට කෙරෙන පූජා ආදිය නො පිරිහෙලා ඉටු කිරීම.
7. යම්තාක් සිය රටට නො පැමිණි රහතන් වහන්සේලාගේ පැමිණීම පිණිසත්, පැමිණෙන රහතන් වහන්සේලාට පහසුවෙන් වෙසෙනු පිණිසත් හොඳින් දැහැමි ආරක්ෂාව සැලසීම. **(දීඝ නිකාය, 1976: 112-117).**

මෙම අපරිහානීය ධර්මයන් වජ්ජීන් විසින් ආරක්ෂා කරන තුරු වජ්ජීන් විනාශ නො වන බව බුදුන් වහන්සේ දේශනා කළහ. 'යම්තාක් කල් සත් අපරිහානීය දහම්හු වැදෑවන් කෙරෙහි සිටිනාහු ද, වැදෑවෝ මේ සත් අපරිහානීය දහම්හි සිටියාහු ද, බමුණ, ඒ තාක් ම වැදෑවනට වැඩීම ඇවෙක්සිය යුතු, පිරිහීම නොම ඇවෙක්සිය යුතු යැයි' **(එම, 117)** දක්වා වජ්ජීන්ගේ විනාශය කල්යන බව දේශනා කළහ. සප්ත අපරිහානීය දහම් කොන්දේසි හතක් ලෙස බොහෝ තැන්හි භාවිත කරයි. නමුත් අපරිහානීය දහම් කොන්දේසි නො ව ආචාරධර්ම පද්ධතියක් වශයෙන් භාවිත කිරීම වඩා සුදුසු ය. ඊට හේතුව වනුයේ අපරිහානීය ධර්ම සදාචාරය හා සම්බන්ධ වීම ය. තවද කාලීන සමාජයේ පැවති හා රාජ්‍යයේ මැදිහත්වීම මත සිදු වන විෂමාචාර ගොන්නක් වශයෙන් ද මේවා හඳුනාගත හැකි ය. අන් රාජ්‍යන් පරිහානිය කරා ගමන් කරනුයේ ආචාර සම්පන්නව ක්‍රියා නො කිරීම හේතුවෙනි.

අපරිහානීය දහම්හි එන 'නිතර නිතර රැස්වීම' යන කරුණ හැරෙන්නට අනෙක් සියලු කරුණු ප්‍රායෝගික සදාචාරයන් ය. පළමු කරුණ පුද්ගලිකවාදය සමාජයෙන් ප්‍රහාණය කිරීම අදහස් කොට ඇති බව මහාචාර්ය ඩී. ජේ. කලුපහන දක්වා ඇත. **(කලුපහන, 2005: 196).** දෙවැනි අංගයේ පටන් සත්වැන්න දක්වා වූ සදාචාරාංග ක්‍රියාත්මක වීම මත සමාජයෙහි විෂමාචාර බිහි නො වේ. රාජ්‍ය පාලකයන් අවැඩ නො කරන කල්හි රට වැසියා ද යහපතෙහි යෙදෙනු ලැබේ. එ බැවින් බුදුන් වහන්සේ දේශනා කරනුයේ සප්ත අපරිහානීය දහම් යම්තාක් සුරකින්නේ ද ඒතාක් රට සුරක්ෂිත වන බව යි. එය සුරැකීමේ වගකීම පවතිනුයේ පාලක පන්තිය වෙත ය. සප්ත අපරිහානීය දහම්වලට අමතර ව රාජ්‍ය පාලන තන්ත්‍රය තුළ පැවතිය යුතු ප්‍රතිපත්ති දහයක් දසරාජ ධර්ම ලෙස මහාහංස ජාතකයෙහි දක්වා ඇත. දසරාජ ධර්මයන්හි පිහිටි බැවින් පරලොවට බිය නැති බව දක්වා දසරාජ ධර්ම ධෘතරාෂ්ට්‍ර රජු විසින් පක්ෂිරාජයාට සඳහන් කරනු ලැබේ.

1. දන් දීම
2. සිල් රැකීම
3. පරිත්‍යාගය
4. ඍජු බව
5. මෘදු බව
6. උපොසථශීල සංඛ්‍යාත තපස
7. මෛත්‍රී පූර්වාංග කොට ඇති අක්‍රොධය
8. කරුණා පූර්වාංග කොට ඇති අවිහිංසාව
9. අධි වාසනා සංඛ්‍යාත ක්ෂාන්තිය

10. එකඟ බව (**ඛුද්දක නිකාය, 1976: 352-353).**

මෙම ධර්මයන් රජෙකු තුළ පැවතිය යුතු බව දැක් වේ. අංග දහයකින් හෙබි සියලු කරුණු කෙරෙන් බිහි වනුයේ ආචාරධර්මීය ලක්‍ෂණ වේ. පාලකයාගෙන් ඉහත සඳහන් ආචාරධර්මයන් ක්‍රියාත්මක වන්නේ නම් රජය දැහැමින් පවත්වා ගෙන යාමට හැකියාව ලැබේ. එසේ ම පාලකයා ඒකාධිපතියෙකු හෝ ආඥාදායකයෙකු බවට පත්වීම ද මෙයින් වැළකේ. (**වජිර හිමි, 2014: 192).** විශේෂයෙන් අවිරෝධතා හෙවත් එකඟ බව යන කරුණින් ප්‍රකට වනුයේ විවිධ මතයන්ට ඇහුම්කන් දීම ය. බොහෝවිට රාජ්‍යන්හි ගැටලු මතු වනුයේ රජු තුළ පවතින නො නැමෙන ස්වභාවය යි. නමුත් විවිධ මතයන්ට ඇහුම්කන් දීමට හැකි වන්නේ නම් එය ආචාර සම්පන්න බවකි. බුදුන් වහන්සේ ද ධම්ම රාජයාණන් වහන්සේ (ධම්මරාජස්ස සාවකා) වශයෙන් වෙනත් මතයන්ට ඇහුම්කන් දුන්හ. වස් ශික්‍ෂා පදය පනවනුයේ වෙනත් මතවලට ඇහුම්කන් දීමේ ප්‍රතිඵලයක් වශයෙනි. එ බැවින් පාලකයා මෙම දසරාජ ධර්මයන් පිළිපැදිය යුතු ය. එසේ පිළිපදින කල්හි ආචාර සම්පන්න භාවය හේතුවෙන් රජය පිරිහීමට පත් නො වේ. ජාතකපාළියෙහි එන තේසකුණ ජාතකයෙහි ද රජෙක් තුළ පැවතිය යුතු රාජ ව්‍රත කිහිපයක් දක්වා ඇත. රජ කෙනෙකු

- පළමු ව බොරුව
- දෙවනු ව ක්‍රෝධය
- තෙවනු ව ක්‍රීඩාශීලි ස්වභාවය (**ඛුද්දක නිකාය, 1976: 166-167).**

දුරු කළ යුතු බව කිය වේ. මෙම ව්‍රතයන්ගෙන් වැළකී රාජ්‍ය විචාළ යුතු ය. ඒ අනුව රාජ්‍ය විචාළීමට පූර්වයෙන් පුහුණු කළ යුතු වනුයේ උක්ත කාර්යන් ය. මෙහි විශේෂත්වය වනුයේ රජකුට අවශ්‍ය දුනු ශිල්පය ආදි කාර්යන් නො ව සාමාජීය සත්වයෙකු ලෙස අවශ්‍ය හික්මීම පුරුදු කරවීම ය. රජෙකු තුළ බොරුව, ක්‍රොධය හා ක්‍රීඩාශීලී බව නො පවතින කල්හි රාජ්‍ය තුළ ද එයට පැවතීමට නො හැකි ය. ආමාත්‍යවරුන්ගේ පටන් සාමාන්‍ය පුරවැසියා දක්වා එම ආචාරධර්මයන් පැවතිය යුතු ය. එහෙත් රාජ්‍ය පාලකයා යම් හෙයකින් ක්‍රීඩාශීලීත්වයට ලොල් කරන්නේ නම්, බොරු කියන්නේ නම් හා වෛරයෙන් පළි ගන්නේ නම් රටක් සාමකාමී ව පවත්වා ගත නො හැකි ය. එහෙත් රජු එයින් වැළකී සිටින කල්හි එවැන්නක් රාජ්‍ය තුළ ක්‍රියාත්මක විය නො හැකි ය. එ බැවින් පළමු ව රාජ්‍ය පාලකයා ආචාර්ය සම්පන්න වීම වැදගත් වේ. තේසකුණ ජාතකයෙහි සඳහන් විශේෂ අවධානයට ලක් කළ යුතු කාරණයක් වනුයේ රජ කෙනෙකු ක්‍රිඩාවට ලොල් වීම නො කළ යුත්තක් බව දක්වා තිබීම ය. රාජ්‍ය පිරිහීම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි සූදුව වැනි ක්‍රීඩාංග ප්‍රමුඛ වේ. රජ කෙනෙකු නො ව ඕනෑම පුද්ගලයෙකු ක්‍රිඩාවට ලොල් වූ විට පරිහානිය කරා ගමන් කරයි. (මෙහි දී සාමාන්‍ය ශරීර සෞඛ්‍යට හිතකර ක්‍රිඩා අපේක්‍ෂා නො කරයි) මීට අමතර ව පාලකයන් විසින් පිළිපැදිය යුතු ප්‍රතිපත්ති හතරක් **අංගුත්තර නිකායේ** චතුක්ක නිපාතයේ දැක් වේ. (**වජිර හිමි, 2014: 194).**

- දානය
- ප්‍රියවචනය
- අත්ථචරියාව
- සමානාත්මතාව

දානය හෙවත් පරිත්‍යාගය රජ කෙනෙකු තුළ මෙන් ම සාමාන්‍ය පුරවැසියා තුළ ද පැවතිය යුතු ආචාරධර්මයකි. ප්‍රියවචනය යනුවෙන් හැඳින්වෙනුයේ පරුෂ වචනයෙන් වෙන් වී යහපත් වචන කථා කිරීම යි. රාජ්‍ය තන්ත්‍රය ශක්තිමත් වීමට ප්‍රිය වචනය අත්‍යවශ්‍ය සාධකයක් වේ. ප්‍රිය වචනය නොමැති වූ විට අන්තර් පුද්ගල සබඳතා බිඳ වැටෙන අතර රාජ්‍ය අරාජික වීම ද සිදු වූ බව ඉතිහාසගත තොරතුරුවලින් පැහැදිලි කළ හැකි ය. අනර්ථ ක්‍රියාවන්ගෙන් වෙන් වී අර්ථවත් ක්‍රියා කළ යුතු බව අත්ථචරියාවෙන් කිය වේ. සමානාත්මතාව ලෙස විග්‍රහ වනුයේ සියලු දෙනා සමාන ආකාරයෙන් සලකා ක්‍රියා කිරීම ය. දුප්පත් පොහොසත් භේද හෝ වර්ණ භේද නො සලකා සියල්ලෝ මනුස්සයෝ ය යන පදනම මත ක්‍රියා කළ යුතු බව කිය වේ. එ ලෙස රජු ධාර්මික ව ක්‍රියා කරන කල්හි රජය දැහැමි වන අතර අධාර්මික ක්‍රියා කරන කල්හි රජය අධාර්මික වන බව ද බුදුන් වහන්සේ දේශනා කොට ඇත.

අධම්මික සූත්‍රයේ සඳහන් පරිදි රජ දරුවෝ අධාර්මික වන කල්හි රාජ පුරුෂයෝ අධාර්මික වෙත්. රාජ පුරුෂයන් අධාර්මික වූ කල්හි බ්‍රාහ්මණ ගෘහපතීහු අධාර්මික වෙත්, පිළිවෙළින් ජනපදවාසීහු, ජනපද වාසීහු අධාර්මික වූ විට චන්ද්‍ර සූර්යාගේ පටන් දෙවියන් දක්වා සියල්ලෝ විෂම වෙති. දෙවියන් විෂම වීමෙන් වැස්ස සම්‍යක් ධාරයෙන් නො ලැබෙන අතර භවභෝග සම්පත් විනාශ වේ. එ විට මිනිස්සු අල්පායුෂ වන අතර බොහෝ ආබාධ ද හටගනී. **(අංගුත්තර නිකාය 4, 1976: 141-142)**. ඒ අනුව රටෙහි මුල් වැසියාගේ අධාර්මික බව අමාත්‍යවරුන්ගේ පටන් සියල්ලට බලපාන ආකාරය මෙම සූත්‍රයෙන් පැහැදිලි කෙරේ. මෙහි විශේෂත්වය වනුයේ රටෙහි පාලකයාගේ පාලන ප්‍රතිපත්ති ස්වභාව දහමට ද බලපාන බව දක්වා තිබීම ය. ඍතු විපර්යාස ඇති වීමට ද පාලකයාගේ ධාර්මික බව හේතු වේ. මේ හා සමාන පාලන තන්ත්‍රයක් ගෙනගිය රජ කෙනෙකු පිළිබඳ තොරතුරු ගණ්ඩතින්දු ජාතකයෙන් හමු වේ. පාලකයාගේ අධාර්මික බවට ස්වභාව දහම පිළිතුරු දක්වන අයුරු එහි මනාව පැහැදිලි කොට ඇත. යම් රජ කෙනෙකු ධාර්මික ව රාජ්‍ය කරන්නේ නම් මෙහි විරුද්ධ අංශය වූ යහපත් ප්‍රතිඵල ලැබෙන බව මෙම සූත්‍රයේ වැඩි දුරටත් අවධාරණය කොට ඇත. 'සබ්බං රට්ඨං සුඛං සේති රාජා චේ හොති ධම්මිකො' **(එම.142-143)**. යන ආකාරයට රජු ධාර්මික වූ විට රාජ්‍ය ද යහපත් වේ.

මීට අමතර ව රජ කෙනෙකුගේ යශස් පිරිහෙන ආකාරය අගති සූත්‍රයෙහි දැක් වේ. යම් රජෙකු සතර අගතියෙන් (ඡන්ද, දොස, භය, මෝහ) යුක්ත වන්නේ නම් 'නිහීයන්ති තස්ස යසො කාලපක්ඛෙව චන්දිමාති' යන ආකාරයට අවපස සඳ මෙන් යශස් පිරිහෙන බව දේශනා කොට ඇත. **(අංගුත්තර නිකාය 2, 1976: 13)**. මේ

ආකාරයට සදාචාරය මත පදනම් වූ බෞද්ධ දේශපාලන ආචාරධර්ම සම්බන්ධයෙන් මහාචාර්ය කේ. එන්. ජයතිලක කරුණු හතරක් මගින් රජයට යුතුකම් පවතින බව පෙන්වා දේ.

- රාජ්‍ය පාලනයේ දී මිනිස් අයිතිවාසිකම් සුරකිමින් පාලනය කළ යුතු ය.
- රටේ අපරාධ නැති කළ යුතු ය.
- නිර්ධන පන්තියක් ඇති නො වන පරිදි ධනය සාධාරණ ව බෙදෙන ආර්ථික රටාවක් ගොඩ නැගිය යුතු ය.
- රාජ්‍ය ප්‍රතිපත්ති ධාර්මික මූලධර්ම මත සැකසිය යුතු ය. **(තිලකරත්න, 2001: 298).**

ජයතිලකයන් පෙන්වා දෙන පරිදි බෞද්ධ රාජ්‍ය පාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් රජය විසින් ඉහත යුතුකම් ඉටු කළ යුතු ය. මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ යුතුකම මගින් අපේක්ෂා කරනුයේ රජයෙන් හෝ වෙනත් කිසිඳු බලපෑමකින් තොර ව වාසය කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම යි. එසේ ම හැකිතාක් දුරට තිරිසන් සතුන්ට ද අභය දානය දීම කළ යුතු බව ජයතිලකයන් පෙන්වා දෙයි. මානව අයිතිවාසිකම් තහවුරු කිරීමත් සමඟ රටෙහි අපරාධ නැති කළ යුතු ය. විශේෂයෙන් සියලු දෙනාට මුදල් භාවිත කළ හැකි පන්ති භේද නොමැති ආර්ථික රටාවක් නිර්මාණය කිරීම ද රාජ්‍යයෙහි වගකීමක් වේ. ඒ සියල්ල ධාර්මික ප්‍රතිපත්තියක පිහිටා සිදු කළ යුතු ය. යම් රජ කෙනෙකු අධාර්මික ව හෝ ඒකාධිපති පාලනයක් ගෙන යන්නේ නම් එයට විරුද්ධ ව ක්‍රියා කළ යුතු බව ද බෞද්ධ ඉගැන්වීම්හි විග්‍රහ වේ. එයට හේතුව වනුයේ අධාර්මික පාලනයෙහි පාලිතයන් රට වැසියන් වීම ය. ජනතාවගේ කැමත්තෙන් රජු නෙරපිය නො හැකි නම් විප්ලවයකින් හෝ එය කළ යුතු ය. **(එම)**. පදකුසල මාණව ජාතකය, මහා සුතසෝම ජාතකය, සච්චංකිර ජාතකය, මනිචෝර ජාතකය, කණ්ඩහාල ජාතකය වැනි ජාතක කතා මගින් අධාර්මික නායකයන් රාජ්‍යත්වයෙන් පහ කළ ආකාරය කියවේ.

දේශපාලන ක්‍රියාවලිය තුළ වර්තමානයෙහි මෙන් ම අතීතයේ ද අනිවාර්ය අංගයක් වශයෙන් පවතින යුද්ධය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ද ආචාරධාර්මික අංගයක් වශයෙන් ගෙන මෙහි දී සාකච්ඡා කළ හැකි ය. අතීතයේ දී රජකම ලැබීමට සුදුස්සෙකු කඩු ශිල්ප, දුනු ශිල්ප යනාදිය හැදෑරීම අනිවාර්ය අංගයකි. ඊට හේතුව වනුයේ යුද්ධයට අවශ්‍ය පුහුණුව කුඩා කල සිට ම ලබා දීම ය. එහෙත් බුදුන් වහන්සේගේ ඉගැන්වීම තුළ පුරුදු පුහුණු කළ යුතු වනුයේ සදාචාරාංගයන් වේ. යුද්ධය නො කළ යුත්තක් බව බුදුන් වහන්සේ දේශනා කොට ඇත. යුද්ධයේ දී දක්ෂ ව යුධ වැදි පුද්ගලයෙකු මියගිය විට දිව්‍යලෝකයේ යන්නේ දැයි බුදුන් වහන්සේගෙන් යුධ නායකයෙකු විමසන ලදි. එහි දී බුදුන් වහන්දේ දේශනා කරන ලද්දේ එ වැන්නක් කිසිසේත් සිදු නො වන බවත් අයහපත් ක්‍රියාවේ ප්‍රතිඵල ඔහුට විඳීමට සිදුවන බවත් ය **(එම. 284)**. ධම්මපදයේ සඳහන් පහත ගාථාවෙන් යුද්ධය නො ව දඬුවම ද ප්‍රතික්ෂේප කොට ඇති බව මනාව තහවුරු වේ.

'' සබ්බෙ තසන්ති දණ්ඩස්ස - සබ්බෙ භායනති මච්චුනො
අතතානං උපමං කතවා - න හනෙය්‍ය න ඝාතයෙ''

**(සුමන හිමි, 2016: 73).**

තමා උපමාවට ගනිමින් දඬුවම් කිරීම හෝ ඝාතනය කිරීම නො කළ යුතු ඉන් කියවේ. ඒ අනුව යුද්ධය බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කරන ලද්දක් බව පැහැදිලි ය. මේ ආකාරයට හඳුනාගත හැකි බෞද්ධ දේශපාලන ආචාරධර්මයන් සාමාන්‍ය දේශපාලන ආචාරධර්මයන් අතික්‍රමණය කරන්නක් බව පැහැදිලි කරුණකි. බෞද්ධ දේශපාලන ආචාරධර්මයන්හි පදනම ධර්මය වේ. ධර්මය මත පදනම් වූ පාලකයෙකුගෙන් අපේක්ෂා කරනුයේ ද ධර්මිෂ්ඨ පාලනයකි. භාරතීය අන්‍ය ආගම්හි පැනෙන දේශපාලන ආචාරධර්ම දේවවාදී ආභාසය මත පෝෂණය වෙමින් වර්ධනය වී ඇත. එ වැනි පාලනයක් තුළ ආදානග්‍රාහී පුද්ගලිකත්වය (Posessive individialism) මතුවෙන අතර ප්‍රජා ශුභ සිද්ධි වර්ධනය පසෙක තබා සිය රාජ්‍ය පුළුල් කිරීමේ ව්‍යායාමයෙහි නිරත වීම සිදු වේ. රාජ්‍ය පුළුල් කර ගැනීම බොහෝ පාලකයන්ගේ රුචිකත්වයකි. මෙහි දී බුදුන් වහන්සේ දේශනා කරන ලද්දේ බලය යොදා ගනිමින් රාජ්‍ය පුළුල් කරනවාට වඩා පහසුවෙන් ධර්මයෙන් රාජ්‍ය ලබා ගැනීම සිදු කළ හැකි බව යි. චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් පරිදි රජු ධාර්මික වූ විට දිය ගොඩ හැම තැන්හි රාජ්‍ය ව්‍යාප්ත කළ හැකි ය. අවි ආයුධ භාවිතයකින් තොර ව ධර්මයේ පිහිටීම මගින් පමණක් රාජ්‍ය ව්‍යාප්ත කළ හැකි වෙනත් ඉගැන්වීම් නොමැති තරම් ය. බෞද්ධ දේශපාලන ආචාරධර්මයන් පිළිබඳ මෙතෙක් සිදු කළ අධ්‍යයනයෙහි සුවිශේෂී දේශපාලන ආචාර ධර්ම කිහිපයක් පවතින බව හඳුනාගත හැකි ය.

- සමූහාණ්ඩු පාලනයට ප්‍රමුඛත්වයක් ලබා දීම
- ධර්මය රාජ්‍යත්වයේ සංකේතය වශයෙන් පැවතීම
- පරම්පරා රාජ පදවිය වෙනුවට සුදුකමින් රාජ්‍යත්වය ලබා ගැනීම
- රජ මාළිගාවේ මෙන් ම රටේ ද ආරක්ෂාව ප්‍රමුඛ වීම
- රට වැසියාට හා සියලු සතුන්ට ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීම
- ධනය බෙදී යන සමානුපාත ආර්ථික රටාවක අවශ්‍යතාව මතු කිරීම
- ආගමික උපදේශ අවශ්‍ය බව.

## සමාලෝචනය

මේ ආකාරයේ ප්‍රධාන දේශපාලන හරපද්ධතියකින් සමන්විත බෞද්ධ ඉගැන්වීම්හි රාජ නීතිය බුද්ධ නීතියට යටත් බව ද දේශනා කොට ඇත. බෞද්ධ දේශපාලන ආචාර ධර්මයන්හි සුවිශේෂීත්වය වනුයේ ප්‍රධාන පුරවැසියාගේ පටන් සත්වයන් දක්වා සියල්ලෙහි ආරක්ෂාව තහවුරු වීම ය. එසේ ම ධර්මය රාජ පාලනයෙහි න්‍යෂ්ටිය වශයෙන් භාවිත කිරීම අන්‍ය ප්‍රධාන ලක්ෂණය යි. ධර්මය යනුවෙන් හැඳින්වෙනුයේ සියලු දෙනාට උචිත ප්‍රායෝගික චර්යාව යි. එහෙත් ඇතැම්

ආගමික ග්‍රන්ථවල ධර්මය යනුවෙන් හැඳින්වෙනුයේ ඒ ඒ කුලවලට අයත් කාර්ය සිදු කිරීම වේ. බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව ස්වධර්ම ක්‍රියාත්මක කිරීම පමණක් සෑහේ. ක්ෂත්‍රිය වංශිකයන්ට අයත් ස්වධර්මයක් වනුයේ යුද්ධය යි. නමුත් බුදුන් වහන්සේගේ ඉගැන්වීම තුළ හිංසාවට ඉඩක් නොමැති බව පූර්ව කරුණුවලින් පැහැදිලි වේ. එ බැවින් බෞද්ධ දේශපාලන ආචාර ධර්මයන් උගෙන නූතන දේශපාලනඥයන් කටයුතු කරන්නේ නම් වඩා ප්‍රායෝගික ලෝකයක් නිර්මාණය කිරීමට හැකියාවක් ලැබෙනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය

**අංගුත්තර නිකාය** 2, (1976). අගති සූත්‍රය. බු.ජ.මු.

**අංගුත්තර නිකාය** 3, (1976). ධම්මරාජ සූත්‍රය. බු.ජ.මු.

**අංගුත්තර නිකාය** 4, (1976). අධම්මික සූත්‍රය. බු.ජ.මු.

**ඛුද්දක නිකාය, ජාතක පාළිය**, (1976). තෙසකුණ ජාතකය. බු.ජ.මු.

**ඛුද්දක නිකාය, ජාතක පාළිය**, (1976). මහාහංස ජාතකය. බු.ජ.මු.

**දීඝ නිකාය, පාථික වග්ගය**, (1976). අග්ගඤ්ඤ සූත්‍රය. බු.ජ.මු,

**දීඝ නිකාය, පාථික වග්ගය**, (1976). චක්‍රවර්ති සීහනාද සූත්‍රය. බු.ජ.මු,

**දීඝ නිකාය, මහා වග්ගය**, (1976). මහාපරිනිබ්බාණ සූත්‍රය. බු.ජ.මු.

## ද්විතීයක මූලාශ්‍රය

කලුපහන, ඩී.ජේ. (2005). **මුල් බුදුසමයෙහි ආචාර විද්‍යාව.** (ප්‍රකාශිත ස්ථානය සඳහන් නොවේ) තිවිර ප්‍රකාශන.

තිලකරත්න, හේ.මු. (2001). **මහාචාර්ය කේ. එන්. ජයතිලක දර්ශනය.** කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වජිර හිමි, කුඹුරුගමුවේ. **'බෞද්ධ දේශපාලන චින්තනය'** (2014). බෞද්ධ හා පාලි අධ්‍යයන (අතිපූජ්‍ය පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද මහානායක මාහිමි ජන්ම ශතසංවත්සර අනුස්මරණ ශාස්ත්‍රීය කලාපය) (සංස්.) ගොඩගම මංගල හිමි සහ මාදිපොල විමලජෝති හිමි, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සමරනායක, ගාමිණී. (2004). **දේශපාලන චින්තනයේ ප්‍රභවය හා විකාශනය.** කර්තෘ ප්‍රකාශන.

සුමන හිමි, කොට්ටාවේ. (2016). ධම්ම පදය පොල්ගස්ඕවිට: ප්‍රතිපත්ති ශාසනික යෝගාවචර සංගමය.